**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2016**

---

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ (ඇ) (3) හා 2010 ජුලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නළ ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම හා සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 24,458.70 කට සමාන එජඩො මිලියන 183.9 ක් වන අතර ඉන් රු.මිලියන 21,945 කට සමාන එජඩො මිලියන 165 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ

විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක අත්තිකාරම් හා එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක අත්තිකාරම, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------------

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

ව්‍යාපෘතියේ කාර්යයන් 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට වූ අනුරූපී සංඛ්‍යා සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

ශ්‍රී ලංකා රජය විසින් ගෙවන ලද රු.මිලියන 14.19 ක් වූ ණය ශේෂයන් සඳහා පොලිය ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකය යටතේ දක්වනු වෙනුවට විදේශ ණය යටතේ ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂය සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව, අදාළ වැඩ නිම කළ වහාම අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද, අවස්ථා 06 කදී ලබාදෙන ලද එකතුව රු.මිලියන 1.20 ක අත්තිකාරම් අදාළ කාර්යයන් නිම කර මාස 01 සිට මාස 04 දක්වා කාලයක් ප්‍රමාද කිරීමෙන් පසුව නිරවුල් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද දේපළ, පිරියත හා උපකරණ සහ ඉන්වෙන්ට්‍රි විෂයයන් පිළිබඳව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජා සං සං | 165.00 | 21,945.00 | 2,200.00 | 9.58 | 1,381.44 | 9.58 | 1,381.44 |
| ශ්‍රී ලං ර | 5.00 | 665.00 | 57.17 | 0.43 | 58.06 | 0.48 | 64.90 |
| ප්‍රජා දායකත්වය | 13.90 | 1,848.70 | - | - | - | - | - |
| එකතුව | 183.90 | 24,458.70 | 2,257.17 | 10.01 | 1,439.50 | 10.06 | 1,446.34 |

ඉහත තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 2,200 ක වෙන් කිරීම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 1,381.44 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද ව්‍යාපෘතියේ පළමු මෙහෙයුම් වර්ෂය තුළ සියයට 9.60 ක මූල්‍ය ප්‍රගතියක් ඉටු කර ගැනීමට අපේක්ෂා කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට සියයට 2.16 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ඉටුකර ගෙන තිබුණි. සැලසුම්ගත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සමස්ත කාල පරිච්ඡේදය සඳහා විස්තරාත්මක සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අරමුණු කළ කාර්යයන් සඳහා මූල්‍ය ගිවිසුමේ වෙන්කරන ලද අරමුදල් කාලීනව උපයෝජනය කිරීමේ අවදානමක් පවතින බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ලියකියවිලි අනුව, නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය වර්ධනය කිරීම හා ජලයේ ගුණත්වය සැලසුම් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යනාදී වශයෙන් සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීම සඳහා සැලසුම් කරන ලද නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් සහ සනීපාරක්ෂක යෝජනා

ක්‍රම පුනරුත්ථාපනය කිරීම හා ව්‍යාප්ත කිරීම සංරචකය යටතේ බදුල්ල, රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්කවල සිවිල් ඉදිකිරීම් වැඩ, එම ඉදිකිරීම් වැඩ සඳහා යෝග්‍ය ඉඩම් කැබලි අත්පත් කරගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් මුහුණ දුන් දුෂ්කරතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.3.** **කොන්ත්‍රාත් පරිපාලනය**

**----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සනීපාරක්ෂක වැඩසටහන් අයත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ, ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව ආදී සනීපාරක්ෂක වැඩසටහන් පිළිබඳ තොරතුරු එහි ඇතුළත් කර නොතිබුණි. එබැවින් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සඳහන් පරිදි කිලිනොච්චි, බදුල්ල හා මුලතිව් දිස්ත්‍රික්කවල සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සනීපාරක්ෂක වැඩසටහන් හඳුනා ගත නොහැකි වූ අතර ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳිය නොහැකි විය.

(ආ) බදුල්ල හා කෑගල්ල දිස්ත්රික්කවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා පස් පරීක්ෂණ කාර්යයන් සිදුකිරීමට 2016 ජුනි මාසයේදී රු.මිලියන 2.41 ක මුදලක් පුද්ගලික සමාගමකට ගෙවා තිබූ බවත් අදාළ වාර්තා සම්පූර්ණ කර 2017 ජුනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ ඉඩම් කැබලි ව්‍යාපෘතියට අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) කුලී පදනම මත වර්ෂ 05 ක් සඳහා රු.370,000 ක මාසික කුලියකට නුගේගොඩ ගොඩනැගිල්ලක් ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. අවශ්‍යතා උපලේඛනයේ 1.1.3 වගන්තිය ප්‍රකාරව, පර්චස් 40 ක ඉඩම් කොටසක් ලබා ගත යුතු වුවද ගොඩනැගිල්ලට අදාළ වූ ඉඩම් කොටස පර්චස් 10.76 ක් වූ බව නිරීක්ෂණය විය.

**3.4** **මතභේදයට තුඩුදෙන කරුණු**

**----------------------------------**

2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 1/2016 දරන චක්‍රලේඛයට පටහැනිව, පිටස්තර සමාගමක සේවකයන් 62 ක් ව්‍යාපෘතිය විසින් යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. ඔවුන්ගේ වැටුප් හා වෙනත් දීමනා සඳහා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් රු.මිලියන 7.72 ක මුදලක් වැය කර තිබුණි.